# 14 රබන් වයමු - දෝං තා

රබාන වාදන භාණ්ඩයකි. රබානෙන් වාදනය කරන පද 'රබන් පද' ලෙස හැඳින්වේ. රබාන වාදනය කිරීම හෙවත් 'රබන් ගැසීම' අපේ පැරණි ජන ක්‍රීඩාවකි.

අතීතයේ අප රට වැසියෝ මඟුල් ගෙවල්වල රබන් වයා විනෝද වූහ. සිංහල අවුරුදු කාලයට රබන් වයමින් නැටූහ. අතීතයේ ආගමික උත්සවවල දී ද රබන් වැයූ බව අප අසා තිබේ. මේ සඳහා භාවිත කරන ලද්දේ මහ රබාන හෙවත් බංකු රබාන යි. රබාන 'එකැස් බෙරය' නමින් ද හඳුන්වා තිබේ.

රබන් පද වාදනය මෙන් ගායනය ද විනෝදජනක ය. රබන් පද ගායනා කර එය වාදනය කරන අයුරු පෙන්වීම ඇතැමුන්ට විනෝදයකි. මේ පාඩමට ඇතුළත් වන්නේ එවැනි රබන් පද කිහිපයකි.

ගඟෙන් එගොඩ ගඟ අසබඩ
ගසක පැණි දොඩම්
තක දොං ගසක පැණි දොඩම්
තක දොං....
ගසක පැණි දොඩම්

තාක්ක දොං දොං - තාක්ක දොං දොං
තේක්ක මල් පිපිලා
ඔන්න බලන් සකි - මෙන්න බලන් සකි
පාරට අතු නැමිලා

වමත හුරුැයි - දෝං තා
දකුණ හුරුැයි - දෝං තා
වමත හුරුැයි - දකුණ හුරුැයි
දෙක ම හුරුැයි - දෝං තා




නොමිලේ බෙදා හැරීම සඳහා ය.

රන් රඹුටන් ගස් දෙක යට
ගිනි කුකුළන් පස් දෙන යි
උන්ට කන්න බත් දෙන විට
උනුත් එක්ක ලස්සන යි

අපේ ගෙදර තුන් දෙන යි
උඩහ ගෙදර තුන් දෙන යි
පහළ ගෙදර තුන් දෙන යි
තුන් පොළේ ම නව දෙන යි

රෑන ගිරවු නටතෙයි ගුඳං ගුඳ
පේර දොඩම් වැටෙතෙයි විටිං විට
පේර දොඩම් වැටෙතෙයි

## අවබෝධය

1. පාඩම කියවා ප්‍රශ්නවලට උත්තර දෙන්න.

   i. රබන් වාදනය කරන අවස්ථා මොනවා ද?

   ii. රබාන හැඳින්වීමට යොදා ගත් වෙනත් නමක් පාඩමෙන් උපුටා දක්වන්න.

   iii. පාඩමෙහි කියැවෙන ජන ක්‍රීඩාව කුමක් ද?

## ක්‍රියාකාරකම 1

**කණ්ඩායම්වලට බෙදී එක් කණ්ඩායමක් ගායනා කරන රබන් පද අනෙක් කණ්ඩායම වාදනය කරන්න.**

## ක්‍රියාකාරකම 2

**ඔබත් රබන් පදයක් නිර්මාණය කරන්න. එය පන්තියට ඉදිරිපත් කරන්න.**